
# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වසනීයත්ව දර්ශකය

## මූලික වාර්තාව



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය- සෝෂල් ඉන්ඩිකේටර්

අගෝස්තු 2024

# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වසනීයත්ව දර්ශකය

## මූලික වාර්තාව

# අන්තර්ගතය


හැඳින්වීම 4

ක්‍රමවේදය 5

සොයාගැනීම් 6

ආර්ථික තත්ත්වය 6

ප්‍රස්තාර 01: වසරකට පෙර හා සසඳන විට ඔබ ඔබේ වත්මන් ආර්ථික තත්ත්වය විස්තර කරන්නේ කෙසේද - ජාතික 6

ප්‍රස්තාර 02: වසරකට පෙර හා සසඳන විට ඔබ ඔබේ වත්මන් ආර්ථික තත්ත්වය විස්තර කරන්නේ කෙසේද - ජනවාර්ගිකත්වය 7

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහාය 7

ප්‍රස්තාර 03: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහායෙන් ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට කොතෙක් දුරට හැකියාවක් ඇති දැයි ඔබ විශ්වාස කරන්නේද - ජාතික 7

ප්‍රස්තාර 04: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහායෙන් ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට කොතෙක් දුරට හැකියාවක් ඇති දැයි ඔබ විශ්වාස කරන්නේද - ජනවාර්ගිකත්වය 8

ආර්ථික අර්බුදයේ පසුකාලීන ප්‍රගතිය 8

ප්‍රස්තාර 05: ශ්‍රී ලංකාව පසුගිය වසර දෙක තුළ, ආර්ථික අර්බුදය විසඳීමට කොතරම් දුරට සමත් වී ඇති දැයි ඔබ සිතනවාද - ජාතික 8

ප්‍රස්තාර 06: ශ්‍රී ලංකාව පසුගිය වසර දෙක තුළ, ආර්ථික අර්බුදය විසඳීමට කොතරම් දුරට සමත් වී ඇති දැයි ඔබ සිතනවාද - ජනවාර්ගික 9

ජනාධිපතිවරණය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම 9

ප්‍රස්තාර 07: ඊළඟ මාසයේ ජනාධිපතිවරණයක් පැවැතුනහොත් ඔබ ඡන්දය භාවිතා කරනවාද? -ජාතික 9

ප්‍රස්තාර 08: ඊළඟ මාසයේ ජනාධිපතිවරණයක් පැවැතුනහොත්, ඔබ ඡන්දය භාවිතා කරනවාද? -ජනවාර්ගික 10

වගු 01: ඊළඟ මාසයේ ජනාධිපතිවරණයක් පැවැතුනහොත්, ඔබ ඡන්දය භාවිතා කරනවාද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 10

ප්‍රස්තාර 09: ඔබ ඡන්දය භාවිතා කරන්නේ කුමන අපේක්ෂකයාට ද යන්න ඔබ දැනටමත් තීරණය කර තිබේද?- ජාතික 10

ප්‍රස්තාර 10: ඔබ ඡන්දය භාවිතා කරන්නේ කුමන අපේක්ෂකයාට ද යන්න ඔබ දැනටමත් තීරණය කර තිබේද?- ජනවාර්ගික 11

වගු 02: ඔබ ඡන්දය භාවිතා කරන්නේ කුමන අපේක්ෂකයාට ද යන්න ඔබ දැනටමත් තීරණය කර තිබේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 11

ආර්ථික අර්බුදය විසඳීම සඳහා ජනාධිපතිවරණයේ ප්‍රතිඵලයේ වැදගත්වීම 11

ප්‍රස්තාර 11: මෙම ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීමට කෙතරම් දුරට වැදගත් යැයි ඔබ සිතනවාද? - ජාතික 12

ප්‍රස්තාර 12: මෙම ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීමට කෙතරම් දුරට වැදගත් යැයි ඔබ සිතනවාද? - ජනවාර්ගික 12

වගු 03: මෙම ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීමට කෙතරම් දුරට වැදගත් යැයි ඔබ සිතනවාද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 12

රජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය 13

ප්‍රස්තාර 13: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ පිළිබඳ දැනුවත්භාවය - ජාතික 13

ප්‍රස්තාර 14: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගිකත්වය 14

වගු 04: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ පිළිබඳ දැනුවත්භාවය - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 15

රජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් සඳහා සහාය 15

ප්‍රස්තාර 15: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ සඳහා සහාය - ජාතික 16

ප්‍රස්තාර 16: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ සඳහා සහාය - ජනවාර්ගිකත්වය 17

වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගැනීමට/නම් කිරීමට සහාය වීම 18

ප්‍රස්තාර 17: ජනාධිපති නුවරඑළියේ පැවති මැයි දින රැලිය අමතමින් වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගනු ලබන බව පැවසීයි මේ සඳහා සහාය දක්වනවා ද? - ජාතික 18

ප්‍රස්තාර 18: ජනාධිපති නුවරඑළියේ පැවති මැයි දින රැලිය අමතමින් වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගනු ලබන බව පැවසීයි මේ සඳහා සහාය දක්වනවා ද? - ජනවාර්ගිකත්වය 18

වගු 05: ජනාධිපති නුවරඑළියේ පැවති මැයි දින රැලිය අමතමින් වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගනු ලබන බව පැවසීයි මේ සඳහා සහාය දක්වනවා ද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 19

ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව දැනුවත්භාවය 19

ප්‍රස්තාර 19: ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට, ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව ඔබ කෙතරම්දුරට දැනුවත්දැයි සිතන්නේද? - ජාතික 19

ප්‍රස්තාර 20: ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට, ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව ඔබ කෙතරම්දුරට දැනුවත්දැයි සිතන්නේද? -ජනවාර්ගිකත්වය 20

වගු 06: ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට, ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව ඔබ කෙතරම්දුරට දැනුවත්දැයි සිතන්නේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 20

අපේක්ෂකයාගේ හැකියාවන් කෙරෙහි විශ්වාසය 21

ප්‍රස්තාර 21: ප්‍රධාන අපේක්ෂකයින් තිදෙනාගෙන්, පහත සඳහන් එක් එක් දේවලවට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? -ජාතික 21

ප්‍රස්තාර 22: රටේ ආර්ථික අර්බුදය විසඳීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 22

ප්‍රස්තාර 23: ආර්ථික අර්බුදය විසඳීම සඳහා වඩාත් හොඳ එකඟතාවයකට පැමිණීමට IMF සමඟ සාකච්ඡා සිදු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 23

ප්‍රස්තාර 24: සුළුතර ප්‍රජාවන්ගේ ගැටලුව විසඳීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද?- ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 24

ප්‍රස්තාර 25: පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 25

ප්‍රස්තාර 26: ආර්ථික අර්බුදයට වගකිවයුත්තන්ව වගවීමට ලක් කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 26

ප්‍රස්තාර 27: රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 27

ප්‍රස්තාර 28: විරැකියාවට විසඳුම් ලබා දීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 28

ප්‍රස්තාර 29: ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 29

ප්‍රස්තාර 30: පශ්චාත් යුධ සංහිඳියාව සහ සංක්‍රාන්තික යුක්තිය තහවුරු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 30

ප්‍රස්තාර 31: දූෂණ විරෝධී පියවර තහවුරු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 31

ප්‍රස්තාර 32: ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා විකල්ප ප්‍රවේශයන් සෙවීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 32

ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු අපේක්ෂකයා 33

ප්‍රස්තාර 33: ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුද? - ජාතික 33

ප්‍රස්තාර 34: ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුද? - ජනවාර්ගික 33

වගු 07: ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 34

# හැඳින්වීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වසනීයත්වය දර්ශකයේ අදියර හයෙහි සොයාගැනීම් මත පදනම්ව මෙම වාර්තාව සකස් කර ඇත. මෙම දීප ව්‍යාප්ත සමීක්ෂණය මඟින් ආර්ථික ප්‍රතිසංස්කරණ, සංහිඳියාව, යහපාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලපිරීම් සම්බන්ධයෙන් වර්තමාන රටේ පවතින තත්ත්වය පිළිබඳ ආණ්ඩුවේ හැසිරීමේ නීත්‍යානුකූලභාවය සහ වගවීම පිළිබඳ මහජන මතය ග්‍රහණය කර ගැනීම සිදු කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියට පදනම් වී තිබෙන රටේ අදහස් දැක්වීමට අවස්ථාවක් නැති බහුතරයකගේ අදහස පිළිබඳ වර්තමාන දේශපාලන සංවාදයට එක් කිරීම මෙම සමීක්ෂණයේ පරමාර්ථය වන්නේ ය. එමඟින්, ජනාධිපතිවරණයට පෙරාතුව, තීරණාත්මක ඡන්දයේදී ජනතාවට වඩාත් දැනුවත්භාවී තීරණයක් ගැනීමට සහ පොහොසත් දේශපාලන සංවාදයකට, මෙම සමීක්ෂණ වාර්තාව දායක වනු ඇතැයි සෝෂල් ඉන්ඩිකේටර් - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අපේක්ෂා කරයි.

# ක්‍රමවේදය


ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් හතරෙන් (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) තෝරාගත් පුද්ගලයන් 1352 ක නියැදියකින් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් මෙම සමීක්ෂණය සිදු කරන ලදී. දත්ත එකතු කිරීම සඳහා මුහුණට මුහුණ ලා සිදු කරන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කර ඇති අතර මෙම සමීක්ෂණයට ක්ෂේත්‍ර සමීක්ෂකයන් 71 ක් (පුරුෂ සහ ස්ත්‍රී) සහභාගී කරගෙන දත්ත රැස් කිරීම සිදු කරන ලදී. ජනගහනයේ ජනවාර්ගිකත්වය සහ ප්‍රාදේශීය විවිධත්වයග්‍රහණය කර ගැනීම සඳහා බහු-අදියර අහඹු ස්ථර නියැදි තාක්ෂණය භාවිතයෙන් නියැදිය තෝරා ගන්නා ලදී. එබැවින් මෙම සමීක්ෂණය  දිස්ත්‍රික්ක 25 තුළ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශයන්හි වෙසෙන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම අදහස් ලබා ගෙන සිදු කර ඇත. මෙම සමීක්ෂණය සඳහා ක්ෂේත්‍ර කටයුතු 2024 ජුලි මස 1 සිට ජුලි මස 12 අතර කාලයේ සිදු කරන ලදී. ජනවාර්ගික සහ දිස්ත්‍රික්කයේ සැබෑ ජනගහන අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.

# සොයාගැනීම්


## ආර්ථික තත්ත්වය

ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයකට හැඟෙන්නේ තම වර්තමාන ආර්ථික තත්ත්වය මීට වසරකට පෙර තිබූ තත්ත්වයට වඩා නරක බවයි. මෙම මතය සියලුම ජනවාර්ගික ප්‍රජාවන් හරහා දක්නට ලැබේ. කෙසේ නමුත්, සාපේක්ෂ වශයෙන් පහළ ආර්ථික තත්ත්වයන් ඇති මලෙයහ දෙමළ ප්‍රජාවෙන් 35% කට පමණ හැඟෙන්නේ තම වර්තමාන ආර්ථික තත්ත්වය වසරකට පෙර තිබූ තත්ත්වයට වඩා හොඳ අතට හැරී ඇති බවයි.

ප්‍රස්තාර 01: වසරකට පෙර හා සසඳන විට ඔබ ඔබේ වත්මන් ආර්ථික තත්ත්වය විස්තර කරන්නේ කෙසේද - ජාතික




ප්‍රස්තාර 02: වසරකට පෙර හා සසඳන විට ඔබ ඔබේ වත්මන් ආර්ථික තත්ත්වය විස්තර කරන්නේ කෙසේද - ජනවාර්ගිකත්වය





## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහාය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහායෙන් ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට කොතෙක් දුරට හැකියාවක් ඇති දැයි ඔබ විශ්වාස කරන්නේද යන්න පිළිබඳ විමසූ විට ශ්‍රී ලාංකිකයන් බෙදී ගිය මතයක් ප්‍රදර්ශනය කරනු ලබයි. මෙම මතය සියලුම වාර්ගික ප්‍රජාවන් අතර දක්නට ලැබේ.

ප්‍රස්තාර 03: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහායෙන් ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට කොතෙක් දුරට හැකියාවක් ඇති දැයි ඔබ විශ්වාස කරන්නේද - ජාතික




ප්‍රස්තාර 04: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහායෙන් ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට කොතෙක් දුරට හැකියාවක් ඇති දැයි ඔබ විශ්වාස කරන්නේද - ජනවාර්ගිකත්වය





## ආර්ථික අර්බුදයේ පසුකාලීන ප්‍රගතිය

ශ්‍රී ලාංකිකයන්ගෙන් 40%කට වඩා වැඩි ප්‍රමාණයක් විශ්වාස කරන්නේ ආර්ථික අර්බුදය තවමත් පවතින නමුත් දැන් සැළකිය හැකි මට්ටමක ප්‍රගතියක් ලබමින් ඇති බවයි. තවත් 31.8% ක් විශ්වාස කරන්නේ ආර්ථික අර්බුදය තවමත් පවතින අතර, කිසිදු ප්‍රගතියක් ලබා නොමැති බවයි. ඒසේම ආර්ථික අර්බුදය තවදුරටත් නරක අතට හැරී ඇති බව 19.3% ක් විශ්වාස කරයි. මෙහිදී, සියලුම වාර්ගික ප්‍රජාවන් අතර මිශ්‍ර මතයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, "ආර්ථික අර්බුදය තවමත් පවතින නමුත් දැන් සැළකිය හැකි මට්ටමක ප්‍රගතියක් ලබමින් ඇත" යැයි හැගෙන අය අතර අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වලට වඩා දෙමළ ප්‍රජාව සාපේක්ෂ වශයෙන් ඉහළ ය.

ප්‍රස්තාර 05: ශ්‍රී ලංකාව පසුගිය වසර දෙක තුළ, ආර්ථික අර්බුදය විසඳීමට කොතරම් දුරට සමත් වී ඇති දැයි ඔබ සිතනවාද - ජාතික




ප්‍රස්තාර 06: ශ්‍රී ලංකාව පසුගිය වසර දෙක තුළ, ආර්ථික අර්බුදය විසඳීමට කොතරම් දුරට සමත් වී ඇති දැයි ඔබ සිතනවාද - ජනවාර්ගික





## ජනාධිපතිවරණය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම

ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් (81.7%) ප්‍රකාශ කරන්නේ ලබන මාසයේ ජනාධිපතිවරණයක් පැවැත්වුවහොත් තමන් ඡන්දය භාවිතා කරන බවයි. මෙම මතය සියලුම ජනවාර්ගික ප්‍රජාවන්, වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂභාවය සහ ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල ද දක්නට ලැබේ. එසේම, ඡන්දය භාවිතා කරන බව ප්‍රකාශ කරන අය අතර ස්ත්‍රී ජනගහනයට වඩා පුරුෂ ජනගහනය සාපේක්ෂ වශයෙන් ඉහළ ය.

ප්‍රස්තාර 07: ඊළඟ මාසයේ ජනාධිපතිවරණයක් පැවැතුනහොත්, ඔබ ඡන්දය භාවිතා කරනවාද?
- ජාතික



ප්‍රස්තාර 08: ඊළඟ මාසයේ ජනාධිපතිවරණයක් පැවැතුනහොත්, ඔබ ඡන්දය භාවිතා කරනවාද?
- ජනවාර්ගික





වගු 01: ඊළඟ මාසයේ ජනාධිපතිවරණයක් පැවැතුනහොත්, ඔබ ඡන්දය භාවිතා කරනවාද?
- වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ


| | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| ඔව් | 79.4% | 82.9% | 86.8% | 76.6% | 79.0% | 82.3% |
| නැත | 11.3% | 10.0% | 8.4% | 12.4% | 9.5% | 10.6% |
| තීරණය කර නොමැත | 9.2% | 7.1% | 4.9% | 11.0% | 11.5% | 7.1% |

ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමට සැලසුම් කර ඇති අයගෙන්, 57.1% ක් තවමත් කුමන අපේක්ෂකයාට ද ඡන්දය භාවිතා කරන්නේ යන්න තීරණය කර නොමැති බව ප්‍රකාශ කරන අතර, 42.9% ක් ප්‍රකාශ කරන්නේ කුමන අපේක්ෂකයාට ද ඡන්දය භාවිතා කරන්නේ යන්න තීරණය කර ඇති බවයි. කුමන අපේක්ෂකයාට ද ඡන්දය භාවිතා කරන්නේ යන්න තීරණය කර ඇති සහ නැති යන අදහස් දෙක අතර සිංහල ප්‍රජාවගේ මතය බෙදී පවතී. ඊට ප්‍රතිවිරුද්ධව තවමත් තමන් අපේක්ෂකයෙකු තීරණය කර නොමැති බව පවසන අය අතර සුළුතර ප්‍රජාවන් (දෙමළ- 66.4%, මලෛයහ දෙමළ - 64.7%, මුස්ලිම් - 68.7%) ඉහළ අගයක් වාර්තා කරයි. සැලකිය යුතු කරුණක් නම්, කුමන අපේක්ෂකයාට ද ඡන්දය භාවිතා කරන්නේ යන්න සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට සාපෙක්ෂව පුරුෂ සහ නාගරික ප්‍රජාවට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවගෙන් වැඩි පිරිසක් තීරණය කර ඇති බව මෙහිදී දක්නට හැකි වීමයි.

ප්‍රස්තාර 09: ඔබ ඡන්දය භාවිතා කරන්නේ කුමන අපේක්ෂකයාට ද යන්න ඔබ දැනටමත් තීරණය කර තිබේද?- ජාතික



ප්‍රස්තාර 10: ඔබ ඡන්දය භාවිතා කරන්නේ කුමන අපේක්ෂකයාට ද යන්න ඔබ දැනටමත් තීරණය කර තිබේද?- ජනවාර්ගික




වගු 02: ඔබ ඡන්දය භාවිතා කරන්නේ කුමන අපේක්ෂකයාට ද යන්න ඔබ දැනටමත් තීරණය කර තිබේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ

| | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| ඔව් | 41.1% | 43.8% | 49.7% | 35.2% | 33.7% | 44.9% |
| නැත | 58.9% | 56.2% | 50.3% | 64.8% | 66.3% | 55.1% |

## ආර්ථික අර්බුදය විසඳීම සඳහා ජනාධිපතිවරණයේ ප්‍රතිඵලයේ වැදගත්වීම


රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීම සඳහා මැතිවරණ ප්‍රතිඵලයේ වැදගත්කම පිළිබඳව විමසූ විට ශ්‍රී ලාංකිකයන් මිශ්‍ර අදහස් පළ කරයි. මැතිවරණ ප්‍රතිඵලය ආර්ථික අර්බුදය විසඳීමේ ක්‍රියාවලියට දැඩි බලපෑමක් ඇති කරන බව 37.8% ක් ප්‍රකාශ කරන අතර 27.6% ක් ප්‍රකාශ කරන්නේ මැතිවරණ ප්‍රතිඵලය ආර්ථික අර්බුදය විසඳීම සඳහා යම් බලපෑමක් ඇති කරන නමුත් ආර්ථික අර්බුදය විසඳීම සඳහා තීරණාත්මක සාධකයක් නොවන බවයි. එසේම,තවත් ශ්‍රී ලාංකිකයන්ගෙන් 18.6%ක් ප්‍රකාශ කරන්නේ මැතිවරණ ප්‍රතිඵලය ආර්ථික අර්බුදය විසඳීමේ ක්‍රියාවලියට කිසිදු බලපෑමක් නොකරන බවයි.

මැතිවරණ ප්‍රතිඵලය ආර්ථික අර්බුදය විසඳීමේ ක්‍රියාවලියට දැඩි බලපෑමක් ඇති කරනු ඇතැයි හැඟෙන අය, සුළුතර ප්‍රජාවට වඩා සිංහල ප්‍රජාව අතර මෙන්ම නාගරික ප්‍රජාවට වඩා ග්‍රාමීය ප්‍රජාව අතර ද සාපේක්ෂ වශයෙන් ඉහළය.

ප්‍රස්තාර 11: මෙම ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීමට කෙතරම් දුරට වැදගත් යැයි ඔබ සිතනවාද? - ජාතික




ප්‍රස්තාර 12: මෙම ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීමට කෙතරම් දුරට වැදගත් යැයි ඔබ සිතනවාද? - ජනවාර්ගික




වගු 03: මෙම ජනාධිපතිවරණයේ ප්‍රතිඵලය රටේ වර්තමාන ආර්ථික අර්බුදය විසඳීමට කෙතරම් දුරට වැදගත් යැයි ඔබ සිතනවාද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ


| | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| මැතිවරණ ප්‍රතිඵලය ආර්ථික අර්බුදය විසඳීමේ ක්‍රියාවලියට දැඩි බලපෑමක් ඇති කරනු ඇත | 36.6% | 38.4% | 39.6% | 35.9% | 25.1% | 40.7% |
| මැතිවරණ ප්‍රතිඵලය අර්බුදය විසඳීම සඳහා යම් බලපෑමක් ඇති කරන නමුත් ආර්ථික අර්බුදය විසඳීම සඳහා තීරණාත්මක සාධකයක් නොවනු ඇත. | 34.0% | 24.3% | 26.8% | 28.4% | 35.1% | 26.0% |
| මැතිවරණ ප්‍රතිඵලය ආර්ථික අර්බුදය විසඳීමේ ක්‍රියාවලියට කිසිදු බලපෑමක් නොකරනු ඇත | 17.0% | 19.4% | 18.4% | 18.8% | 16.7% | 19.0% |
| නොදනී | 12.4% | 18.0% | 15.3% | 16.9% | 23.1% | 14.4% |

## රජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය


රජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් කිහිපයක් පිළිබඳව දැනුවත්භාවය විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (80% කට වැඩි) ප්‍රකාශ කළේ, දිවයින පුරා පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සියලුම සිසුන් සඳහා නොමිලේ ආහාර ලබා දෙන වැඩසටහන, යුක්තිය - මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධ ක්‍රියාකාරකම් මැඩලීම සඳහා පොලිස් විශේෂ මෙහෙයුම, එසේම වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1700.00 දක්වා වැඩි කිරීම යන වැඩසටහන් පිළිබඳ තමන් දැනුවත් බවයි. ප්‍රතිචාරකයින්ගෙන් 66.8% ක් උරුමය වැඩසටහන යටතේ විවිධ ජන කොටස් සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් දැනුවත්ව සිටියි. කෙසේ නමුත්, ධන බද්ද/ දේපල බද්ද (ආරෝපිත කුලී ආදායම් බද්ද) සම්බන්ධයෙන් සාපේක්ෂව (43.6%) අඩු දැනුවත්භාවයක් පවතින බව මෙහිදී පෙනී යයි.

සියලුම ජනවාර්ගික ප්‍රජාවන්ගේ මතය දෙස බලන විට, ඔවුන්ගෙන් අති බහුතරයක් ප්‍රකාශ කරන්නේ තමන් දිවයින පුරා පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සියලුම සිසුන් සඳහා නොමිලේ ආහාර ලබා දෙන වැඩසටහන පිළිබඳව දැනුවත් බවයි. යුක්තිය - මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධ ක්‍රියාකාරකම් මැඩලීම සඳහා පොලිස් විශේෂ මෙහෙයුම සම්බන්ධයෙන් බහුතර දැනුවත්භාවයක් ඇති සිංහල සහ මුස්ලිම් ප්‍රතිචාරකයන් හා සසඳන විට දෙමළ සහ මලෙයහ දෙමළ ප්‍රජාවන්ගේ දැනුවත්භාවය සාපේක්ෂ වශයෙන් අඩුය. එසේම මලෙයහ දෙමළ ප්‍රජාවේ අති බහුතරයක් වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1700.00 දක්වා වැඩි කිරීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් ය. උරුමය වැඩසටහන යටතේ විවිධ ජන කොටස් සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම සම්බන්ධයෙන්, සියලුම ජනවාර්ගික ප්‍රජාවන් අතර දැනුවත්භාවය 50% සිට 70% දක්වා වෙනස් වේ.

ප්‍රස්තාර 13: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ පිළිබඳ දැනුවත්භාවය - ජාතික



ප්‍රස්තාර 14: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගිකත්වය




වගු 04: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ පිළිබඳ දැනුවත්භාවය - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ

| දැනුවත් | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| දිවයින පුරා පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සියලුම සිසුන් සඳහා නොමිලේ ආහාර ලබා දෙන වැඩසටහන | 85.5% | 89.9% | 85.1% | 91.6% | 88.9% | 88.2% |
| යුක්තිය - මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධ ක්‍රියාකාරකම් මැඩලීම සඳහා පොලිස් විශේෂ මෙහෙයුම | 85.3% | 85.4% | 88.8% | 81.9% | 85.7% | 85.4% |
| වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1700.00 දක්වා වැඩි කිරීම | 70.8% | 85.3% | 79.7% | 80.6% | 77.3% | 80.8% |
| උරුමය වැඩසටහන යටතේ විවිධ ජන කොටස් සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම | 57.9% | 71.6% | 67.5% | 65.9% | 57.8% | 68.8% |
| ධන බද්ද/ දේපල බද්ද (ආරෝපිත කුලී ආදායම් බද්ද) | 36.8% | 47.4% | 45.6% | 41.8% | 53.8% | 41.3% |
| ස්ත්‍රීන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත | 32.1% | 36.2% | 31.3% | 38.4% | 31.3% | 35.6% |
| ශ්‍රී රාමායණ මංපෙත - ශ්‍රී ලංකාව තුළ රාමායන පුරාවෘත්තය හා සම්බන්ධ ඓතිහාසික ස්ථාන සම්බන්ධ කරන රාමායණ මංපෙත ව්‍යාපෘතිය | 11.6% | 15.3% | 15.0% | 12.9% | 22.2% | 12.1% |


## රජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් සඳහා සහාය

රජය විසින් ආරම්භ කරන ලද වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවයක් ඇති අය අතරින් අති බහුතරයක් (90% කට වැඩි) දිවයින පුරා පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සියලුම සිසුන් සඳහා නොමිලේ ආහාර ලබා දෙන වැඩසටහනට, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1700.00 දක්වා වැඩි කිරීමට, යුක්තිය - මත්ද්‍රව්‍ය හා අපරාධ සම්බන්ධ ක්‍රියාකාරකම් මැඩලීම සඳහා පොලිස් විශේෂ මෙහෙයුමට, ස්ත්‍රීන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතට මෙන්ම උරුමය වැඩසටහන යටතේ විවිධ ජන කොටස් සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම යන වැඩසටහන්වලට සහාය දක්වයි. කෙසේ නමුත්, ධන බද්ද/ දේපල බද්ද (ආරෝපිත කුලී ආදායම් බද්ද) සඳහා සහාය පළ කරන අය සැලකිය යුතු ලෙස අඩුය (32.7%). එසේම, මෙවැනි ම මත රටාවක්/ප්‍රවණතාවයක් ජනවාර්ගික ප්‍රජාවන් අතර ද දක්නට ලැබේ.

ප්‍රස්තාර 15: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ සඳහා සහාය - ජාතික




ප්‍රස්තාර 16: පසුගිය මාස කිහිපය තුළ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද/ ආරම්භ කරන ලද වැඩසටහන්/තීරණ සඳහා සහාය - ජනවාර්ගිකත්වය




## වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගැනීමේ යෝජනාව පිළිබඳ සහාය වීම

වතු ලයින් නිවාස නීත්‍යානුකූල ගම්මාන ලෙස හඳුනා ගැනීම පිළිබඳ ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ යෝජනාවට සහාය දෙන බව බහුතරයක් (74.6%) ප්‍රකාශ කරයි. සියලුම ජනවාර්ගික කණ්ඩායම්වල බහුතරයක් මෙම මතයට සහාය දක්වන අතර, සිංහල (76%) සහ මලෛයහ දෙමළ (89.3%) ප්‍රජාවන් අතර මෙම මතයට සහාය දැක්වීම ඉතා ඉහළය.

ප්‍රස්තාර 17: ජනාධිපති නුවරඑළියේ පැවති මැයි දින රැලිය අමතමින් වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගනු ලබන බව පැවසීය. මේ සඳහා සහාය දක්වනවා ද? - ජාතික




ප්‍රස්තාර 18: ජනාධිපති නුවරඑළියේ පැවති මැයි දින රැලිය අමතමින් වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගනු ලබන බව පැවසීය. මේ සඳහා සහාය දක්වනවා ද? - ජනවාර්ගිකත්වය




වගු 05: ජනාධිපති නුවරඑළියේ පැවති මැයි දින රැලිය අමතමින් වතු ලයින් නිවාස නීත්‍යානුකූලව ගම්මාන ලෙස හඳුනා ගනු ලබන බව පැවසීය. මේ සඳහා සහාය දක්වනවා ද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ

| | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| සහාය දක්වයි | 73.9% | 75.1% | 76.3% | 72.9% | 75.3% | 74.5% |
| සහාය නොදක්වයි | 10.5% | 11.7% | 10.4% | 12.1% | 11.6% | 11.2% |
| නොදනී | 15.5% | 13.2% | 13.2% | 15.0% | 13.1% | 14.3% |


## ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව දැනුවත්භාවය

ජනාධිපති අපේක්ෂකයින්ගේ (රනිල් වික්‍රමසිංහ, සජිත් ප්‍රේමදාස සහ අනුර කුමාර දිසානායක) ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් මිශ්‍ර මතයක් ප්‍රකාශ කරයි. මෙම මතය සියලුම ජනවාර්ගික ප්‍රජාවන් අතර දක්නට ලැබෙන අතර, සිංහල (49.2%) සහ මලෛයහ දෙමළ (56.1%) ප්‍රජාවන් අතර සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක දැනුවත්භාවයක් පවතී. එසේම,වැඩිහිටි ජනගහනය (අවුරුදු 30 ට වැඩි) සහ පුරුෂ ජනගහනය අතර ද දැනුවත්භාවය ඉහළ ය.

ප්‍රස්තාර 19: ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට, ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව ඔබ කෙතරම්දුරට දැනුවත්දැයි සිතන්නේද? - ජාතික



ප්‍රස්තාර 20: ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට, ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව ඔබ කෙතරම්දුරට දැනුවත්දැයි සිතන්නේද? -ජනවාර්ගිකත්වය





වගු 06: ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට, ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳව ඔබ කෙතරම්දුරට දැනුවත්දැයි සිතන්නේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ

| | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| සියලුම අපේක්ෂකයින්ගේ ප්‍රතිපත්ති පිළිබඳව මම හොඳින් දැන්වත්ය | 18.4% | 26.4% | 26.2% | 21.0% | 20.6% | 24.3% |
| මගේ අපේක්ෂකයාගේ ප්‍රතිපත්ති පිළිබඳ මම හොඳින් දැන්වත් නමුත් අන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් වැඩිදුර නොදනී | 23.5% | 23.0% | 26.9% | 19.4% | 13.5% | 25.4% |
| ප්‍රධාන අපේක්ෂකයන් කිසිවකුගේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් කිසිවක් පිළිබඳ මම දැන්-වත් නැත | 39.0% | 33.8% | 30.9% | 40.3% | 43.7% | 33.8% |
| නොදනී | 19.1% | 16.8% | 16.0% | 19.3% | 22.2% | 16.6% |


## අපේක්ෂකයාගේ හැකියාවන් කෙරෙහි විශ්වාසය

'ආර්ථික අර්බුදය විසඳීම සඳහා වඩාත් හොඳ එකඟතාවයකට පැමිණීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සාකච්ඡා සිදු කිරීම (52.3%)', 'රටේ ආර්ථික අර්බුදය විසඳීම' (39.4%) සහ 'ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා විකල්ප ප්‍රවේශයන් සෙවීම'(33.1%) යන දේවලවට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා රනිල් වික්‍රමසිංහට ඇති හැකියාව පිළිබඳව ශ්‍රී ලාංකිකයෝ වැඩි විශ්වාසයක් පළ කරති. එසේම විශේෂයෙන්, පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම සම්බන්ධයෙන් ඔවුන් කිසිවකු විශ්වාස කරන බවක් පෙනෙන්නේ නැත.


ප්‍රස්තාර 21: ප්‍රධාන අපේක්ෂකයින් තිදෙනාගෙන්, පහත සඳහන් එක් එක් දේවලවට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජාතික




ප්‍රස්තාර 22: රටේ ආර්ථික අර්බුදය විසඳීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 23: ආර්ථික අර්බුදය විසඳීම සඳහා වඩාත් හොඳ එකඟතාවයකට පැමිණීමට IMF සමඟ සාකච්ඡා සිදු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද?
- ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 24: සුළුතර ප්‍රජාවන්ගේ ගැටලුව විසඳීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 25: පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 26: ආර්ථික අර්බුදයට වගකිවයුත්තන්ව වගවීමට ලක් කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 27: රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 28: විරැකියාවට විසඳුම් ලබා දීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 29: ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 30: පශ්චාත් යුධ සංහිඳියාව සහ සංක්‍රාන්තික යුක්තිය තහවුරු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ



ප්‍රස්තාර 31: දූෂණ විරෝධී පියවර තහවුරු කිරීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




ප්‍රස්තාර 32: ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා විකල්ප ප්‍රවේශයන් සෙවීම සඳහා ඔබ වැඩිපුරම විශ්වාස කරන්නේ කුමන අපේක්ෂකයාද? - ජනවාර්ගිකත්වය, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ




## ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු අපේක්ෂකයා

ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා (රැකියාව, හොඳ වැටුපක්, ඉඩමක් හෝ නිවසක්, යම් මූදල් ආධාර ආදිය) විසඳා ගැනීමට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුරුන්දැයි ශ්‍රී ලාංකිකයන්ගෙන් විමසූ විට මිශ්‍ර අදහස් ප්‍රකාශ කරයි. මෙහිදී, 24.3%ක් රනිල් වික්‍රමසිංහ බව ප්‍රකාශ කරන අතර තවත් 19.3%ක් සජිත් ප්‍රේමදාස යැයි ප්‍රකාශ කරයි. එසේම, 15.5%ක් ප්‍රකාශ කරන්නේ අනුර කුමාර දිසානායක බවයි.

ප්‍රස්තාර 33: ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුද? - ජාතික




ප්‍රස්තාර 34: ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුද? - ජනවාර්ගික



වගු 07: ඔබගේ පවුලේ වර්තමාන අවශ්‍යතා විසඳා ගැනීමටට වඩාත් සුදුසු යැයි ඔබ සිතන අපේක්ෂකයා කවුද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ

| | වයස | | ස්ත්‍රී පුරුෂභාවය | | ප්‍රදේශය | |
|---|---|---|---|---|---|---|
| | අවුරුදු 18-29 | අවුරුදු 30 ට වැඩි | පුරුෂ | ස්ත්‍රී | නාගරික | ග්‍රාමීය |
| අනුර කුමාර දිසානායක | 16.6% | 14.8% | 21.5% | 9.3% | 14.3% | 15.8% |
| සජිත් ප්‍රේමදාස | 21.0% | 18.4% | 16.5% | 22.2% | 26.6% | 17.7% |
| රනිල් වික්‍රමසිංහ | 20.1% | 26.5% | 24.4% | 24.0% | 18.7% | 25.5% |
| ඉහත කිසිවක් නොවේ | 30.8% | 27.8% | 26.8% | 30.8% | 29.8% | 28.6% |
| නොදනී | 11.5% | 12.5% | 10.8% | 13.6% | 10.7% | 12.5% |

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමඟින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.


ලිපිනයː නො. 6/1 B, 1/1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.
දුරකථන: +94 (11) 2584050
වෙබ්ː www.cpalanka.org.survey-research


Marking Social Research Count

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


ලිපිනයː නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.
දුරකථනː +94(11)2081384-6
වෙබ්ː http://www.cpalanka.org


CPA
Centre for Policy Alternatives

25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES